# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

## අති විශේෂ

අංක 2451/24 - 2025 අගෝස්තු මස 27 වැනි බදාදා - 2025.08.27

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)

# I වැනි කොටස: (I) වැනි ඡෙදය - සාමාන්‍ය

## රජයේ නිවේදන

**සංශෝධිත 1973 අංක 25 දරන ක්‍රීඩා පනතේ 32 සහ 33 වගන්ති අනුව තරුණ කටයුතු හා ක්‍රීඩා අමාත්‍යවරයා විසින් සාදන ලද නියෝග**

තරුණ කටයුතු හා ක්‍රීඩා අමාත්‍ය සුනිල් කුමාර ගමගේ වන මම, සංශෝධිත 1973 අංක 25 දරන ක්‍රීඩා පනතේ 32 සහ 33 වගන්ති අනුව තරුණ කටයුතු හා ක්‍රීඩා අමාත්‍යවරයා ලෙස මා වෙත පැවරී ඇති බලතල ප්‍රකාරව පහත පරිදි නියෝග කරමි;

01. මම, 1973 අංක 25 දරන ක්‍රීඩා පනත සහ එහි සංශෝධනවල 32 සහ 33 වගන්ති යටතේ මා වෙත පවරා ඇති බලතල ප්‍රකාරව, ශ්‍රී ලංකා කරාතේ දෝ සම්මේලනයෙහි ලියාපදිංචිය තාවකාලිකව අත්හිටුවමි.

02. මම, 1973 අංක 25 දරන ක්‍රීඩා පනත සහ එහි සංශෝධනවල 32 සහ 33 වගන්ති යටතේ මා වෙත පවරා ඇති බලතල ප්‍රකාරව, ශ්‍රී ලංකා කරාතේ දෝ සම්මේලනය සඳහා නව **ව්‍යවස්ථාවක් සම්මත කිරීම**, ශ්‍රී ලංකා කරාතේ දෝ සම්මේලනය සඳහා නව **ව්‍යවස්ථාව යටතේ සුදුසුකම් ලත් සාමාජිකයින් ලියාපදිංචි කිරීම සහ** ශ්‍රී ලංකා කරාතේ දෝ සම්මේලනය සඳහා නව **ව්‍යවස්ථාව යටතේ විශේෂ මහා සභා රැස්වීම සහ වාර්ෂික මහ සභා රැස්වීම** පැවැත්වීම **යන සීමිත කාරණා සඳහා** පහත සාමාජිකයින්ගෙන් සමන්විත **ක්‍රියාකාරී කාර්ය බලකායක් (Working Task Force)** මෙයින් පත් කරමි.

1. විශ්‍රාමික නියෝජ්‍ය පොලිස්පති, එම්. එච්. මාර්සෝ මහතා - සභාපති
2. ජාතික ඔලිම්පික් කමිටුවේ නියෝජිත, නිලූක කරුණාරත්න මහතා
3. විශ්‍රාමික ජ්‍යෙෂ්ඨ පොලිස් අධිකාරි, ආර්. එම්. එල්. එන්. බණ්ඩාර මහතා
4. පී. උපුල් අබේවික්‍රම මහතා
5. නීතිඥ එම්. එච්. ආනන්ද කුමාර මහතා

1A - G 45256 — 05 (2025/08)

*මෙම අති විශෙෂ ගැසට් පත්‍රය* www.documents.gov.lk *වෙබ් අඩවියෙන් බාගත කළ හැක.*

03. 1973 අංක 25 දරන ක්‍රීඩා පනත සහ එහි සංශෝධන අනුව සහ ඒ යටතේ නිකුත් කරන ලද විධිවිධාන අනුව නව ව්‍යවස්ථාව ලියාපදිංචි කිරීමෙන් දින 120ක් ඇතුළත නව නිලධාරීන් පත්කර ගැනීම සඳහා නිලවරණය පවත්වනු ලැබිය යුතු ය.

04. මම මෙයින්, ශ්‍රී ලංකා කරාතේ දෝ සම්මේලනයේ නව ව්‍යවස්ථාව යටතේ පැවැත්වෙන වාර්ෂික මහ සභා රැස්වීමකදී සිය නිලධාරීන් තෝරා පත්කරගන්නා තෙක්, ශ්‍රී ලංකා කරාතේ දෝ සම්මේලනයේ කාර්යයන් කරගෙන යාම සහ කළමනාකරණය කිරීම සඳහා ඉහත කී **ක්‍රියාකාරී කාර්ය බලකාය (Working Task Force)** වෙත බලය පවරා දෙමි.

**සුනිල් කුමාර ගමගේ** (පා.ම.),
තරුණ කටයුතු හා ක්‍රීඩා අමාත්‍ය.

2025 අගෝස්තු මස 27 වැනි දින,
කොළඹ දී ය.

EOG 08 - 0298

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.